# විසර්ජන ශීර්ෂය 119 - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
# විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය

## 1 විගණන විෂය පථය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් පකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලද. සමාලෝචිත වර්ෂය සඳහා වූ කලමනාකරණ විගණන වාර්තාව 2011 නොවැම්බර් 15 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණම සහ සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ වලින් සිදුවන බලපෑම හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### (ආ) ගිණුම් ඉදිරිපත් කිරීම

#### තොරතුරු ඉදිරිපත් නොකිරීම

අමාත්‍යාංශයට අයත් කැබ් රථයක් සහ යතුරු පැදියක් සම්බන්ධ කිසිදු විස්තරයක් විගණනයට ඉදිරිපත් නොවීය. මෙම වාහන සඳහා නිදහස් බලපත්‍ර හම් බවත් නිදහස් බලපත්‍ර පරිගණක ගත කල 2006 වසරේ සිටම මෙම වාහන සඳහා කිසිදු බලපත්‍රයක් ලබා ගෙන නොමැති බවත් බස්නාහිර පලාතේ මෝටර් රථ ප්‍රවාහන පලාත් කොමසාරිස වරයාගේ 2010 සැප්තැම්බර් 07 දින ලිපිය මගින් තහවුරු කර තිබුණි.

### (ඇ) විසර්ජන ගිණුම

#### මුළු ප්‍රතිපාදනය හා වියදම

විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය යටතේ සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු:29,060,918,981 ක් වූ අතර , සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු:26,099,058,364 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු:2,961,860,617 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 10% කි. විස්තර පහත දැක්වේ.

| වියදමේ විස්තරය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම (2010.12.31 දිනට) | ඉතිරිය (2010.12.31 දිනට) | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 1,396,646,000 | 1,388,546,000 | 815,035,690 | 573,510,310 | 41.3 |
| මූලධන | 24,888,140,000 | 27,672,372,981 | 25,284,022,674 | 2,388,350,307 | 8.7 |
| **එකතුව** | **26,284,786,000** | **29,060,918,981** | **26,099,058,364** | **2,961,860,617** | |

**(ii) <u>අය වැය විචලනය</u>**

මෙහෙයුම් වැඩසටහනෙහි ප්‍රාග්ධන වැය හා සංවර්ධන වැඩසටහනේ ප්‍රාග්ධන වැය විෂයයන් 07 කට අදාලව රු. 718,041,000 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි කර තිබුණි. ඊට අමතරව තවත් වැය විෂයයන් 06ක් යටතේ එකතුව රු.628,320,883 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එම වැය විෂයයන් වල මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 49 සිට සියයට 97 දක්වා වූ පරාසයක විය. මෙම ඉතිරිවීම් සඳහා ප්‍රමාණවත් හේතු විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) <u>පොදු තැන්පත් ගිණුම</u>**

මුදල් රෙගුලාසි 427 හි විධිවිධාන ප්‍රකාරව පොදු තැන්පත් ගිණුම් ශේෂ භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නොතිබ අතර 2010 දෙසැම්බර් 31 දිනට රු.12,882,241 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ඉ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය</u>**

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට අයවියයුතු හිග ණය ශේෂය රු.457,408 ක් වූ අතර එය අය කර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක විය.

(ආ) 2005 වර්ෂයේ සිට ඉදිරියට ගෙන විත් තිබුණු රු.1,302,243 ක හඳුනා නොගත් ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට ද නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2004 වර්ෂයට පෙර අමාත්‍යාංශයට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ එකතුව රු 212,092 ක් ණය ශේෂ නිරවුල් නොවී උගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුන අතර ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.3 ඡේදය ප්‍රකාරව අවලංගු කළ නොහැකි පොරොන්දුවකට නිලධාරියා අත්සන් කළ යුතු වවද, ඒ ආකාරයකට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී ගෙවා ඇති ණය මුදල් ප්‍රමාණය රු.1,446,315 ක් විය.

(ඉ) 1998 වර්ෂයේ මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.184,712 ක දේපළ ණය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) ආපදා ණය ගෙවීමේදී ඇප බැඳුම්කරයට යටත් වූ ඇපකරුවෙකුගේ වයස අවුරුදු 56 ක් ඉක්මවා තිබූ අතර ඔහුගේ විශ්‍රාම පාරිතෝෂිකය ඉක්මවා ණය වෙනුවෙන් ඇපවී තිබුණ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

1.4 **<u>වත්කම් කළමනාකරණය</u>**

(අ) **<u>බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්</u>**

අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ලබා දී තිබුණි.

(ආ) **<u>වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.</u>**

අමාත්‍යාංශය විසින් රාජ්‍ය ව්‍යාපාර ජනතාකරණය කිරීමේ අමාත්‍යාංශයට අයත් වාහන 2 ක් ද, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවට අයත් වාහනයක්ද මහවැලි සංවර්ධන අධිකාරියට අයත් වාහනයක් ද, ලංකා විදුලිබල මණ්ඩලයට අයත් වාහන 9 ක් ද අවිධිමත් ලෙස පරිහරණය කර තිබුණි.

1.5 **<u>අනකූල නොවීම්</u>**

**<u>නීති රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.</u>**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණ වූ නීති, රීති හා රෙගුලාසවල විධිවිධාන වලට අනුකල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

(අ) **<u>චක්‍රලේඛ විධිවිධාන</u>**

(i) 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ සඳහන් සීමාවන් ඉක්මවා 2009 වර්ෂයේදී රු.244,796 ක් හා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා රු.58,700 ක දුරකථන වියදම් අමාත්‍යාංශය විසින් දරා තිබුණි.

(ii) රු. මිලියන 2.8 ක මුදලක් වැය වන කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ජේදයෙ විධිවිධාන ප්‍රකාරව මිල ගණන් කැඳවීමට ප්‍රථම මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

1.6 **<u>කාර්යය සාධනය</u>**

**<u>සැලසුම් කිරීම සහ කාර්ය සාධනය</u>**

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු (රු.මි.1998 ක ප්‍රතිපාදන මත) සංවර්ධන වැඩසටහන් 27 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.7 අවිධිමත් ගණුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල නිලධාරීන් 07 දෙනෙකුගේ පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු වශයෙන් රු. 270,000 ක් වැය කර තිබුණද, අමාත්‍යාංශය එම නිලධාරීන් සමග ගිවිසුම් වලට එළැඹී නොතිබුණි.

(ආ) 2010 අපේල් මාසයේ සිට වර්ෂයක කාලයකට අමාත්‍යාංශයට සේවය සඳහා පත් කර තිබූ විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකුට අමාත්‍ය මණ්ඩලයේ තීරණයට පටහැනිව රු.127,389 ක් වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි.

## 1.8 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත දක්වා ඇති පාඩු හා හානි සිදුවූ අවස්ථා නිරීක්ෂණය විය.

(ස) විදුලි බිල්පත් නියමිත කාලය තුලදී නොගෙවීම හේතුකොටගෙන රු. 58,206 ක අධිභාර මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශයට ගෙවීමට සිදුවී තිබුණි.

(සස) 2004 වර්ෂයේ සිට වාහන අනතුරු 36 කින් සිදු වූ රු.1,464,528 ක හානි හා පාඩු විසර්ජන ගිණුමෙන් අනාවරණය කර නොතිබුණි.

## 1.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂනය වූ මෙහෙයුම් අකාර්යක්ෂමතා සම්බන්ධ සාරාංශයක් පහත දැක්වේ.

2010 අයවැය ඇස්තමේන්තුව මගින් පිවිතුරු බලශක්ති ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ උපදේශන සේවා සඳහා ලබාගත් මුළු ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයකට මාරු කර තිබූ නමුත් එම ව්‍යාපෘතියට අදාලව රු.24,459,531 ක වියදමක්

දරා තිබූ බවත් එම වියදම භාණ්ඩාගාරයේ සහ අමාත්‍යාංශ වැය ලෙජරයේ සටහන්ව නොතිබුණු අතර 2010 විසර්ජන ගිණුම මගින්ද අනාවරණය කර නොතිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

## 1.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | ස්ථිර සේවක සංඛ්‍යාව | වෙනත් ආයතන වලින් ලබාගත් සේවක සංඛ්‍යාව | මුළු සේවක සංඛ්‍යාව | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 16 | 02 | 18 | |
| ද්විතියික මට්ටම | 49 | 39 | 09 | 48 | 01 |
| ප්‍රාථමික මට්ටම | 44 | 34 | 05 | 39 | 05 |
| **එකතුව** | **111** | 89 | 16 | **105** | **06** |

## 1.11 අභ්‍යන්තර පාලනය

**(අ) අභ්‍යන්තර විගණනය**

2008 ජුනි 01 දින සිට ස්ථාපිත අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය ගණකාධිකාරී (අභ්‍යන්තර විගණක) සහ එක් කළමනාකරණ සහකාර වරියකගෙන් සමන්විත ව තිබූ අතර 2010 දෙසැම්බර් මාසයේ සිට එම ගණකාධිකාරීවරිය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ මත අමාත්‍යාංශය යටතේම පාලනය වන වෙනත් ආයතනයක අධ්‍යක්ෂක (මුදල්) තනතුරකට ද්විතීයන පදනමින් නිදහස් කර ඊට අමතරව ඇයට අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන තනතුරේ වැඩ බැලීමට ද ඉඩ සලස්වා තිබුණි.

**(ආ) කළමනාකරණ හා විගණන කමිටුව ක්‍රියාත්මක කිරීම**

සමාලෝචිත වර්ෂය තුළ දී පවත්වා තිබුනේ කළමනාකරණ හා විගණන කමිටුවේ රැස්වීම් එකක් පමණි.